*සැ. යු.-* (i) 2022.09.09 දින පළ කරන ලද අංක 2299 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2022 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කළාප වල ජූරි සභිකයින්ගේ නාමාවලියක්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,298 - 2022 සැප්තැම්බර් මස 16 වැනි සිකුරාදා - 2022.09.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 598 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.-* (i) යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ඔක්තෝබර් මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 සැප්තැම්බර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## මිනුවන්ගොඩ දිසා අධිකරණයේ දීය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

සංශෝධිත 1990 අංක 2 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ ඒ ප්‍රකාරව නෛසයි තීන්දු ප්‍රකාශයක් සහ තීන්දු ප්‍රකාශය නියත කැඳවා ගැනීමක් සඳහා කරනු ලබන ඉල්ලීමයි.

සෙලාන් බැන්ක් පීඑල්සී
(කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වන ලද)
සෙලාන් ටවර්ස්, අංක 90,
ගාලු පාර, කොළඹ 03.

නඩු අංකය : MS/70
ස්වභාවය : මුදල්
වටිනාකම : රු. 3,984,721/62
ඇස්කිසි අංකය :

*පැමිණිලිකරු*

එදිරිව

පතිරන්නැහෙලාගේ තිලංක
අශාන් පතිරණ,
අංක 32,
මීරිගම පාර, මරදගහමුල

*විත්තිකරු*

මිනුවන්ගොඩ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 12 වන දින ලබාදෙන ලද නියත තීන්දු ප්‍රකාශයට අනුව විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතු රුපියල් තිස්නම ලක්ෂ අසූහතර දහස් හත්සිය විසි එකයි ශත හැට දෙකක රු. (3,984,721.62) මුදල සහ එම මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් රුපියල් තිස්හය ලක්ෂ පනස් දහස් නවසිය විසි පහයි ශත හයක (රු. 3,650,925.06) මුදලක් මත 2017.07.13 වන දින සිට වාර්ෂිකව 16% බැගින් පොළිය ද, නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින් ද, ඒ අනුව ඉහත නම සඳහන් විත්තිකරුට අයත් දැනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සඳහන් වන දේපළ පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා වර්ෂ **2022 ක් වූ ඔක්තෝබර් මස 12 වැනි දින පෙ. ව. 11.00**ට එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දිවුලපිටිය ප්‍රාදේශීය කොට්ඨාසයේ අංක 58 අකරගම බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අකරගම පිහිටි ''සිතකන්ද වත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. පී. එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1714 සහ වර්ෂ 2005 මාර්තු මස 27 වැනි දින දරන පිඹුරෙහි නිරූපිත ලොට් 6 දරන බිම් කොටස සඳහා මායිම්

| | |
|---|---|
| උතුරට | : ලොට් 1 ද, |
| නැගෙනහිරට | : ලොට් 7 ද |
| දකුණට | : එච්. පී. ජේ. විජේසිංහගේ ඉඩම (ලොට් 4 සහ ලොට් 3 පිඹුරු අංක 1643 A) |
| බස්නාහිරට | : ලොට් 5 ද |

යන මායිම් තුළ වූ පර්චස් තිස් හයයි දශම පහයි තුනක් (පර්. 36.53) විශාලත්වයෙන් යුතු බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගස්, වැවිලි ඇතුලු සියලු දේ ද වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රුරු J/124/18 හි ලියාපදිංචි වී ඇත.

පහත දැක්වෙන ආකාරයට නිවැරදි මාර්ගයට යාබදව ඉඩම විස්තර කෙරේ. :

අකරගම පිහිටි ''සිතකන්ද වත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. පී. එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1714 සහ වර්ෂ 2005.03.27 වන දින දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1 දරන බිම් කොටස සඳහා මායිම් :

| | |
|---|---|
| උතුරට | : අසිලින් විජේගුණවර්ධනගේ ඉඩම |
| නැගෙනහිරට | : ලොට් 7 ද |
| දකුණට | : ලොට් 6, 5 සහ 2 |
| බස්නාහිරට | : පාර ද |

යන මායිම් තුළ වූ පර්චස් දාහතක් (පර්. 17) විශාලත්වයෙන් යුතු බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගස් වැවිලි ඇතුලු සියලු දේ ද වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රුරු/ J/124/19 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම.*-දූනගහ හංදියේ සිට ගොඩිගම පාරෙන් 4km ක් ශ්‍රී විසුද්ධාරාම පන්සල පාර දක්වා පැමිණ එම පාරෙන් මීටර් 500ක් විජයගුණවර්ධන සුබසාධක මධ්‍යස්ථානය දක්වා පැමිණ එතැනින් ඇති අඩි 12 ක පාරක් සඳහා වෙන් කරන ලද කොටසින් මීටර් 75ක් ගියපසු මෙම විෂයගත දේපළ දකුණු පසින් වන්නට පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. (1) ගැණුම් මිලෙන් 25% (2) පළාත් අධිකාරියේ බදු සඳහා 1% (3) ප්‍රචාරණ වියදම් (4) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද, ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මිනුවන්ගොඩ දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. අංශ ප්‍රධානී - නීති, සෙලාන් බැන්ක් පී. එල්. සී - අංක 90, ගාලු පාර, කොළඹ 3.

දුරකථන අංක : 112456485, 0112456479.

ඒ. ඒ. එස්. සී. අදිකාරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - මිනුවන්ගොඩ.

වර්ෂ 2022 ක් වූ අගෝස්තු මස 29 දින දී ය.

09-182

---

## ගම්පහ දිසා අධිකරණයේ දීය.
## පිස්කල් වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය අංක 59 (01) (ආ) සහ 59 (03) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

නඩු අංකය : SPL/ 47/2021
ස්වභාවය : විශේෂ
වටිනාකම : රු. 762,823

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, වලව්වත්ත, කිඩගම්මුල්ල, ගම්පහ

*පෙත්සම්කරු*

එදිරිව

1. තුන්කෝරල අධිපතිගේ රමණී මල්කාන්ති පෙරේරා, අංක 306/ඒ, බොල්ලත, ගනේමුල්ල
2. ජෙනිටා ශිරානි ප්‍රනාන්දු පුල්ලේ, අංක 307/2, පතහවත්ත, බොල්ලත, ගනේමුල්ල
3. තල්වත්තගේ දෝන එස්තරමේරි ස්වර්ණලතා, අංක 305/ඒ, පතහවත්ත, බොල්ලත, ගනේමුල්ල.

*වගඋත්තරකරුවන්*

ඉහත අංක දරන නඩුවේ මෙම අධිකරණයේ 2021.10.26 දිනැති නියෝගය ප්‍රකාරව එකී නඩුවේ 01, 02 සහ 03 වන වග උත්තරකරුවන්ට පෙත්සම්කරුට අයවීමට ඇති රුපියල් හත්ලක්ෂ හැට දෙදස් අටසිය විසි තුන (රු. 762,823) ක මුදල සහ එකී මුදල ගෙවා අවසන් වන තෙක් 2019.09.15 දින සිට මුල් මුදලට වාර්ෂිකව සියයට දහනවය (19%) ක පොළියක් ද, නඩු ගාස්තු සහ නීතිඥ ගාස්තු බැගින් පොලියක් ද ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් සහ එකී මුදල් නිසියාකාරව ගෙවා නොමැති බැවින් එකී මුදල මත නීතිමය පොළිය ද, නඩු ගාස්තු ද ඇස්කීසි ගාස්තු සහ පිස්කල් ගාස්තු ද අයකර ගැනීම සඳහා වර්ෂ 2022ක් වූ ජනවාරි මස 26 වන දින තහනමට ගන්නා ලද එකී නඩුවේ 01 වන වගඋත්තරකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපලෙහි ඔහුට අයත් දේපලෙහි ඔහුට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම් ද වර්ෂ **2022 ක් වූ නොවැම්බර් මස 18 වන දින ප. ව. 2.30ට** එකී දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය* : වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්

- (i) ගැණුම් මිලෙන් සියයට විසි පහ (25%) ක් ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට ප්‍රකාරව නියෝජ්‍ය පිස්කල්තැනගේ ගාස්තු ද, (iii) විකුණුම් සඳහා වන සියලුම වියදම් ද මුදලින් ගෙවිය යුතුය. තව ද ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක් වන (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දකුණු රාගම් පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බොල්ලත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බොල්ලත යන ගමෙහි පිහිටි අලුබෝගහවත්ත, මිල්ලගහවත්ත සහ හොරගහවත්ත නමැති ඉඩමට ජේ. පී. එන්. ජයසුන්දර බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 8341ඒ සහ 2011.03.03 දිනත් දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබලි අංක 16 දරන කොටසට මායිම් :- උතුරට : අංක 15 දරන කැබැල්ල සහ ඩබ්ලිව්. ජී. සංසදාස සහ තවත් අයගේ ඉඩම ද, නැගෙනහිරට : ඩබ්ලිව්. ජී. සංසදාස සහ තවත් අයගේ ඉඩම සහ පාර ද, දකුණට : පාර සහ අංක 17 දරන කැබැල්ල ද, බස්නාහිරට : අංක 17 සහ 38 දරන කැබලි ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් පහලව (පර්. 15) ක් විශාල ඉඩම් කොටස සහ ඊට අයත් ගසකොළ පලතුරු ආදී සැම සියලු දේ ද වේ. (මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක P 121/55 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.)

තවද ඉහත කී අංක 8341ඒ දරන පිඹුරේ අංක 13 සහ 36 දරන පාරට වෙන් කළ බිම් තීරයන් හි පොදු මාර්ග අයිතිය සහ අංක 38 දරන කාණුවට වෙන්කළ බිම් තීරය භාවිතා කිරීමේ පොදු අයිතිය ද ප්‍රාදේශීය සභා මාර්ගයන් ඇතුළු අනෙකුත් සියළුම ආකාරයේ පොදු මාර්ග අයිතිවාසිකම් සමග වේ.

ඒ. එම්. රමනි වීරසිංහ,
නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
ගම්පහ දිසා අධිකරණය.

වර්ෂ 2022ක් වූ සැප්තැම්බර් මස 09 වන දී ය.

09-224

කැස්බෑව දිසා අධිකරණයේ දීය

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මර්කන්ටයිල්
ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ්
ෆිනෑන්ස් පීඑල්සී හැඳින්වූ)

අංක. 236, ගාලු පාර, කොළඹ 03

*පැමිණිලිකරු*

*නඩු අංකය : DHP1709/17*
*ඇස්කිසි අංකය : 10/2020*

-එදිරිව-

01. රණසිංහ ආරච්චිගේ දෝන නදීෂා ප්‍රියංගි රණසිංහ, අංක 268/3, පැලැන්වත්ත, පන්නිපිටිය.

02. රණසිංහ ආරච්චිගේ දොන් චන්ද්‍රදාස අංක 268/3, පැලැන්වත්ත, පන්නිපිටිය.

03. රණසිංහ ආරච්චිගේ දොන් සුමුදු මහේන්ද්‍ර, අංක 343/ඒ, 2, ඇරැව්වල, පන්නිපිටිය,

**දැනට**
අංක 343/1, මහවත්ත පාර, ඇරැව්වල, පන්නිපිටිය,

04. කසුන්ක ගයාන් එදිරිසිංහ, අංක 271, පැලැන්වත්ත, පන්නිපිටිය

*විත්තිකරුවන්*

ඉහත නම් සඳහන් 1 වන සහ 2 වන විත්තිකරුවන් වෙතය.

මෙම නඩුවෙහි වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 10 වන දින ඇතුළත් කර ඇති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි මෙම නඩුවෙහි 1 වන සහ 2 වන විත්තිකරුවන්ට විරුද්ධව රු. 200,976.38 ක ප්‍රමාණ වූ හිඟ වාරික මුදල් එකතුව ගෙවීමටත්,

ඉහත කී හිඟ වාරික මුදල් මත පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා පවතින පොළී අනුපාතය වන මසකට 4%ක පොළී අනුපාතිකයට අදාලව ගණනය කළ පොළී මුදලක්ද, ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දින සිට එකී මුදල් ගෙවා නිම කරන දින දක්වා නෛතික පොළිය ගෙවීමටත්, එකී ගිවිසුම යටතේ කුලියට දීම අවසන් කිරීමෙන් පසු 2015 ක් වූ ජුනි මස 29 වන දින සිට සිදුවී ඇති අලාභ වශයෙන් රු.4,359,092.71 ක මුදලක් අලාභ වශයෙන් ද, එම මුදල සඳහා පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා පවතින පොළී අනුපාතය වන මසකට 4% ක පොළී අනුපාතයට අදාල ගණනය කළ පොළී මුදලක්ද, ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන දින දක්වා නෛතික පොළිය ද ගෙවීමටත්,

වෙනත් වියදම් සඳහා රු. 27,763.10 ක මුදලක්ද, රක්ෂණ ගාස්තු වශයෙන් රු. 72,068.38 ක මුදලක් ද, එකී මුදල් මත පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා පවතින පොළී අනුපාතය වන මසකට 4% ක පොළී අනුපාතිකයට අදාලව ගණනය කළ පොළී මුදලක් ද, ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දින සිට එකී මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දින දක්වා නෛතික පොළිය ද, ගෙවීමටත්, නඩු ගාස්තුද, ගරු අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් වැඩිමනක් සහනයන් ලබා ගැනීමටත් වේ.

සියලුම අයකිරීම් තීන්දු ප්‍රකාශයේ දින සිට මාස 02 ක් තුළදී හෝ එකී තීන්දු ප්‍රකාශයේ අධිකරණය විසින් නියම කරන ඊට වඩා දීර්ඝ කාලයකදී ගෙවීම පැහැර හරින්නේ නම් මෙහි පහත උපලේඛනයේ විස්තර වන හා වර්ෂ 2013.01.07 සහ 2013.04.11 වන දින ලියා සහතික කරන ලද අංක 694 සහ 771 දරන උකස් බැඳුම්කර යටතේ ඇප වශයෙන් තබා ඇති එකී ඉඩම හා ඊට අදාළ දේපළ අධිකරණය විසින් පත් කරන බලයලත් වෙන්දේසිකරුවකු ලවා අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙස ආඥා කරනු ලැබ ඇති බැවින් ද,

එලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව විත්තිකරුවන් විසින් ගෙවීම පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් නිසි ලෙස තහනමට ගෙන ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වෙන නිශ්චල දේපළ ඉඩම හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ ආදී සියලු දේ.

වර්ෂ **2022 ක්** වූ නොවැම්බර් මස 01 වන දින පෙ.ව. 11.00 ට එකී දේපළ පිහිටා ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පැලැන්වත්ත නමැති ගමේ අංක. 268/3 දරන ස්ථානයේදී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේදී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

i. මුල් ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
ii. තක්සේරු ගාස්තුව වන 0.5% ක් ද,
iii. වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම ගැණුම්කරු විසින් අදාල මුදල, මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම් ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව නගර සභා බල ප්‍රදේශය තුළ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැලැන්වත්ත උතුර (582) ග්‍රාම නිලධාරි වසමෙහි පැලැන්වත්ත යන ගම පිහිටි ඇගුලකනත්ත *නොහොත්* එගොඩවත්ත *නොහොත්* එගොඩකනත්ත නමැති

ඉඩමට එස්. පී. ඇල්විටිගල අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 4662 සහ වර්ෂ 2015 ක් වූ මාර්තු මස 15 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ එහි ලොට් වයි දරන බිම් කොටස වන උතුරට : පිඹුරු අංක 4198 හි ලොට් 1 සී ද, නැගෙනහිරට පිඹුරු අංක 4198 හි ලොට් 1 සී, 2 බී සහ 2ඒ ද, දකුණට මෙම පිඹුරේ ලොට් එක්ස් ද, සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් එක්ස් ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් අට (පර්. 8) ක් විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේද යන මෙකී දේපල වේ. මෙම ඉඩම දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C484/14 හි ලියාපදිංචි කර ඇත.

*මාර්ග අයිතිය.*- ඉහත කී පැලැන්වත්ත යන ගම පිහිටි ඇගුලකනත්ත *නොහොත්* එගොඩවත්ත *නොහොත්* එගොඩකනත්ත නමැති ඉඩමට එස්. ජී. ඇල්විටිගල අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 4198 සහ වර්ෂ 2013 ක් ජූනි මස 30 වන දිනත් දරන පිඹුර ප්‍රකාර අඩි 10 ක් පළල පාරක් සඳහා බෙදා වෙන් කළ එකී ලොට් 1 සී දරන බිම් තීරය වන උතුරට - පෞද්ගලික පාර ද, නැගෙනහිරට - මෙම පිඹුරේ ලොට් 2 බී ද, දකුණට : මෙම පිඹුරේ ලොට් 1 බී ද, සහ බස්නාහිරට - පාරක් සඳහා වෙන් කළ බිම් තීරයද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් අටයි දශම හයයි හය (පර්. 8.66) ක් විශාල බිම් තීරයේ පොදු මාර්ග අයිතියද සමග වේ. මෙම ඉඩම දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C484/15 හි ලියාපදිංචි කර ඇත.

*දේපලට පිවිසීම.*- සිකුරාදා පොළ හන්දියෙන් හැරී කි. මී. 1 1/2 ක් කොට්ටාව දෙසට ගමන් ගන්නා විට වම්පස ''දූ දරුවෝ''වලව්ව හමුවේ. ඒ ඉදිරිපිට පිහිටි ඉඩම වේ.

ටී. පී. එස්. සේනානායක,
රෙජිස්ට්‍රාර් - නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කැස්බෑව.

වර්ෂ 2022 ක් වූ සැප්තැම්බර් මස 06 වැනි දින දී ය.

09-190